# කොළඹ දිස්ත්‍රික්කයෙනුත් උක් පැණි සහ හකුරු

සාමාන්‍යයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ සමහරක් ප්‍රදේශවල බොහෝ කලක සිට සුළු වශයෙන් උක් වගාව කෙරුණ මුත්, එම නිෂ්පාදනයන් ප්‍රයෝජනයට ගැනෙනුයේ උත්සව වලට හා ඖෂධ පිළියෙල කිරීමට පමණි. නමුත් මෑතක සිට, සීනි මිල ඉහළ යාමත් සමගම මෙම ප්‍රදේශවල උක් වගා කරන්නන්, උක්පැණි සහ හකුරු නිෂ්පාදනය කිරීමෙන් හොඳ ආදායමක් ලබන බව පෙනෙන්නට තිබේ.

1972 දී කොළඹ දිස්ත්‍රික්කය තුල උක් වගාව පුළුල් කිරීම සඳහා විශේෂ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ව්‍යාප්ති අංශය කරන ලද ප්‍රයත්නයකදී, බොහොමයක් ගොවීන් මෙම වගාවට දැක්වූයේ මඳ උනන්දුවක් බව දැනගන්නට ලැබිණ.

මීරිගම කෘෂිකාර්මික උපදේශක කොට්ඨාශයේ ලොව්වාගොඩ ප්‍රදේශයේ කෘෂිකර්ම



උක් හකුරු පිලියෙල කරන්නේ සෝමපාල මහතාගේ බිරිඳ, සේවිකාවන් කිපදෙනෙකුගේ සහාය ඇතිව තම නිවසේදීමය. ඒ දෙස බලා සිටිනුයේ කේ. කේ. ඒ. සෝමපාල (සිටගෙන) හා කෘ.ව්‍යා.සෙ. කේ. ඩී. පී. ජයවර්ධන (ඉදගෙන) යන මහතුන්වේ.

ව්‍යාප්ති සේවක කේ. ඩී. පී. ජයවර්ධන මහතා අපට මේ ගැන විස්තර කරමින් පැවසුවේ, යන්තම් එම ප්‍රදේශයේ ගොවි මහතුන් දෙදෙනෙකු පමණක් උක් වගාව ආරම්භ කිරීමට පොළඹවා ගැනීමට පුළුවන් වූ බවය. නමුත් ඇත්තෙන් ම එම ගොවි මහතුන් දෙදෙනා, පටන් ගත් සුළු වගාවෙන් දැන් විශාල ආදායමක් ලබාගෙන, ඇති අතර, එම ගොවි මහතුන් දෙදෙනා ඇතුළුව මෙම සාර්ථක නව වගාව ආදර්ශයට ගත් අසල්වාසී ගොවි මහ



4—ජී 10484 (74/10)



අඩක පමණ අස්වැන්න නෙලාගත් එම්. පී. ඩී. විජේසිංහ මහතාගේ (වම කෙලවර) උක් වගාව පරීක්ෂා කරමින් සිටිනුයේ මූලස්ථාන කෘ.උ. මහින්ද හේවාවිතාරණ (මැද) සහ ප්‍රදේශයේ කෘ.උ. පි. එම්. සෝමවර්ධන යන මහතුන් ය.



කාර්මික සංවර්ධන මණ්ඩලයේ කුලියට ලබා ගත් උක් දඬු මිරිකන යන්ත්‍රය, කලට වේලාවට උක්දඬු මිරිකා ගැනීමට බොහෝ ප්‍රයෝජනවත් විය. මෙහි දක්වනුයේ විජේසිංහ මහතා එම යන්ත්‍රයට උක්දඬු දමන ආකාරයයි.

තුන් බොහොමයක් උක් වගාව පූළුල් වශයෙන් කිරීමට ලහි ලහියේ සූදානම් වන බව, ජයවර්ධන මහතා මෙහිදී අපට හඳුන්වා දුන්, මුලින් සඳහන් ගොවි මහතුන් දෙදෙනාගෙන් කෙනෙකු වන කේ. කේ. ඒ. සෝමපාල මහතා පැවසුවේය.

මුංඇට, කව්පි, සෝයා බෝංචි, මිරිස්, කහ, මයියොක්කා, වැල් දොඩම්, කෙසෙල්, අන්නාසි ආදී බෝගයන් රාශියක්ම කාලයක සිටම සාර්ථකව වගාකර ඇති සෝමපාල මහතා, හා හාපුරා කියා අක්. 1 1/4 ක පමණ උක් වගාව ආරම්භ කර ඇත්තේ 1973 වර්ෂයේ ජූලි මස දීය.

සාමාන්‍යයෙන් උක් අක්කරයකින් ලැබෙන අස්වැන්න මිරිකීමෙන් ගත් යුෂ උණු කිරීමෙන් පැණි ගැලුම් 600-650 ක් පමණ ලබා ගත හැකි අතර, එක් පැණි බෝතලයකින් හකුරු රා. 1 1/2 ක් පමණ සෑදිය හැකි බවත්, දැනට පැණි ගැලුමක් රු. 45 කට පමණත් හකුරු රාත්තලක් රු. 8.50 කට පමණක් පහසුවෙන් අලෙවි කළ හැකි බවත්, යනුවෙන් මුල් වරට කරන ලද මෙම වගාවෙන් ලත් අත්දැකීම් සෝමපාල මහතා අපට විස්තර කර දුන්නේ ය.

සාර්ථක අන්නාසි වගාකරන්නකු වශයෙන් මීරිගම ප්‍රදේශයේ ප්‍රසිද්ධ, විශ්‍රාම ලත් ග්‍රාම සේවක මහතෙකු වන එම්. පී. ඩී. විජේසිංහ මහතාත්, මීරිගම කෘ. උ. කොට්ඨාශයෙ සාර්ථක උක් වගාකරන්නෙකු වශයෙන් හැඳින්විය හැක. පලාතේ කෘ. උ. පී. එම්. සෝමවර්ධන මහතාගේ උපදෙස් පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නොමිලයේ දුන් සී. ඕ. 527 වර්ගයම උක් දඬු අක් 1 1/2 ක බදු ඉඩමක ඔහු විසින් වගාකර ඇත.

සාමාන්‍ය ක්‍රමයට බිම සැකසීමෙන් පසු, අඩි 4 ක පරතරයක් ඇතිවනසේ, උදලු තලයක පළල කාණු කපා, පුරුක් 3 කින් යුතු දඬු කැබලි දිග අතට වැලලීමෙන් සිටුවීම කර ඇත. මූලික පොහොර මෙම අවස්ථාවේ දීම යොදා ඇත. සිටුවා මාස 3 ක් පමණ කල් වල් නෙලීම කල යුතුව ඇති අතර, සිටවූ අවස්ථාවේ සිට දඬු මෝරන තෙක් වගාව සඳහා අක්කරයකට රු. 600 පමණ මුදලක් වැයවන බවත් විජේසිංහ මහතා මෙම වගාව සම්බන්ධ වියහියදම් සම්බන්ධව අපට විස්තර කර දුන්නේය. කෙසේ නමුත් අස්වැන්න නෙලීමටත්, මිරිකීමටත් පැණි සහ හකුරු සෑදීමටත් රු. 3000 ක පමණ වියදමක් දරන්නට සිදුවන බව අපට තවදුරටත් ඒ මහතාගෙන් දැනගන්නට ලැබුණා. අවු. 20 ක කාලයක පටන් ගොවිතැන් කර අත් දැකීමක් ඇති ජයසිංහ රාලහාමි, විශාලම ආදායමක් ලබාගත් තනි බෝගය මෙම උක් වගාව බව සතුටින් පැවසුවේය.

සාමාන්‍යයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ දේශීය උක් වර්ග 12 ක් පමණ වගාකෙරෙන නමුත් මේවායේ අඩංගු සීනි ප්‍රමාණය (සුක්රෝස්) එතරම්ම නොසෑහේ. දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ උත්සාහයෙන්, වඩා උසස් ගණයේ අස්වැන්නක් ලබාදෙන සී. ඕ. 527 වර්ගයේ උක් අක්. 160 ක පමණ කොළඹ දිස්ත්‍රික්කයේ වගාකෙරී ඇත. විශේෂයෙන් කොළඹ උක් වගාව කෙරෙන කඩුවෙල, මීරිගම, ගිරිදර, වැලිසර, දොම්පේ ආදී ප්‍රදේශවල 1974 වර්ෂයේදී අක්. ½යේ උක් ආදර්ශණ 20 ක් පැවැත්වීමට විධි විධාන යොදා ඇති බවත්, 1975 වර්ෂය තුළ උක් වගාකර ඇති බිම් ප්‍රමාණය අක්. 500 කින් පමණ වැඩිකිරීමට බලාපොරොත්තු වන බවත්, මෙම කටයුතු භාරව කටයුතු කරන කොළඹ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයේ මූලස්ථාන කෘ. උ. මහින්ද හේවාවිතාරණ මහතා විස්තර කර දුන්නේ ය.

මෝරන ලද උක්දඬු මිරිකාගත් යුෂ තාච්චිවල දමා ඒකාකාර උනුසුම ඇතිව රත් කර මිත් හා දිගටම හැඳිගාමින්ද, උනුකිරීමේදී පෙණ වශයෙන් මතුපිටට එන අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන්ද උක් පැණි සාදගනු ලැබේ. මෙම උක් පැණි පදමට පැමිණි විග සම අච්චු වලට වත්කිරීමෙන් මෘදු ස්වභාවයෙන් යුත් ඉතා රසවත් උක් හකුරු සෑදෙන සැටි, මීරිගම ප්‍රදේශයේ උක් වගාවන් සහ උක් පැණි හා හකුරු සාදනු බැලීමට ගිය කෘෂිකර්ම ප්‍රවෘත්ති අංශයේ අපි කවුරුත් දුටිමු.

කොළඹ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි විසින්, කේ. කේ. ඒ. සෝමපාල මහතාගෙන් ලබාගත් තොරතුරු අනුව සකස් කරන ලද උක් වගාව පිළිබඳ අය-වැය විස්තරය පහත දක්වේ

වගාකරන ලද බිම් ප්‍රමාණය අක්කරයකි

| | රු. | ශ. |
|---|---|---|
| ට්‍රැක්ටරයකින් හෑම සඳහා ... ... ... ... | 70 | 0 |
| හැරෝ කිරීමට ... ... ... ... | 40 | 0 |
| කාණු දැමීමට රු. 4 ගණනේ මිනිසුන් 12 දෙනෙකු ... ... | 48 | 0 |
| සිටුවීමට (කැපීම, පිරිසිදු කිරීම, ගෙනයාම ආදී) රු. 4 ගණනේ මිනිසුන් 20 දෙනෙකු | 80 | 0 |
| පලමු වල් නෙලීම රු. 4 ගණනේ මිනිසුන් 10 දෙනෙකු ... ... | 40 | 0 |
| පොහොර යෙදීම හා පස් එක්කිරීම රු. 4 ගණනේ මිනිසුන් 9 ... ... | 36 | 0 |
| දෙවන වල් නෙලීම රු. 4 ගණනේ මිනිසුන් 10 ... ... | 40 | 0 |
| දෙවන වරට පොහොර යෙදීම රු. 4 ගණනේ මිනිසුන් 8 ... ... | 32 | 0 |
| අස්වැන්න නෙලීම හා මිරිකන යන්ත්‍රය වෙත ගෙනයාම (දුර යාර 75) ... | 812 | 0 |
| මිරිකීම (යාන්ත්‍රික පැය ගණන 108, වැඩකරන දිනකට රු. 50 ගණනේ) ... | 675 | 0 |
| ගැ. 100 තාච්චියක් ඉ.ස.ම. කුලියට ලබාගෙන ඇත. කුලිය දිනකට රු. 10 ගණනේ දින 13 1/2 යි | 135 | 0 |
| තාච්චි 4 ක් සහ පත්ත 2 ක් 'තීවානි' වතුයායෙන් ලබාගෙන ඇත. කුලිය රු. 10 ගණනේ දින 13 1/2 කට | 135 | 0 |
| කම්කරුවන් 42 කු සඳහා (අයෙකුට රු. 6 ගණනේ) ... ... | 252 | 0 |
| උණුකිරීම, පෙරීම, ආදී සඳහා අයෙකුට රු. 5 ගණනේ ගැහැණු 78 ... | 390 | 0 |
| යෙදුම් සඳහා වියදම : බීජ උක්දඬු ප්‍රවාහණය ... ... ... | 150 | 0 |
| පොහොර රු. 26 ගණනේ වී පොහොර 5:15:15 මිශ්‍රණය හොණ්ඩර 4 ක් ... | 104 | 0 |
| යූරියා හො. 1 1/4 ... ... ... ... | 30 | 0 |
| දර සන යාර 53 (රු. 12 ගණනේ) ... ... ... | 636 | 0 |
| | 3,705 | 0 |
| අක්කරයකින් ලබාගත් පැණි ගැ. 600 ය, ගැලුමක් රු. 30 විකිණීමෙන් ලබාගත් ආදායම | 18,000 | 0 |
| මුළු වියදම ... ... ... ... | 3,705 | 0 |
| ශුද්ධ ලාභය ... ... ... ... | 14,295 | 0 |